# මාතලේ දිස්ත්‍රික්කයේ පරිපාලනය, භූ ගෝලීය හා සමාජ ආර්ථික පසුබිම

## මාතලේ දිස්ත්‍රික්කයේ පරිපාලනය ....

**බ්‍රිතාන්‍ය පාලන සමයේ මාතලේ පැවති ආණ්ඩුවේ ඒජන්ත කාර්යාලය**



**මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (පැරණි)**



**වර්තමාන මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**



බ්‍රිතාන්‍යයන්ට යටත්වන තුරු පාලනය ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළ පුද්ගලයා රජු විය. කලක් පිහිටි රටටත්, මායා රටටත්, උඩරටටත් පාලනයට නතුව තිබූ මාතලේ ක්‍රිස්තු වර්ෂ 17වන සියවසේදී ගොඩපල විජයපාල නම් රජුගේ පාලනය යටතට පත් විය. රජු යටතේ සේවය කළ ප්‍රධාන නිල මඩුල්ල වශයෙන් දිසාව, අධිකාරම්, ලේකම් මහත්තයා, රටේ මහත්තයා හා මුහන්දිරම් යන අය හඳුන්වා ඇත.

මාතලේ, ඇතිපොල දුක්ගන්නාරාළ නම් දිසාව යටතේ පාලනය වූ බව මාතලේ කඩයිම් පොතේ සඳහන් වේ. 1818න් පසු උඩරට තනි රෙසිඩන්ට් නිලධාරියා වෙනුවට අධිකාරි හා අධිකරණ බලතල ඇති කොමසාරිස් මණ්ඩලයක් පත් කරන ලදි. මෙහිදී රජය කෙලින්ම මහ ජනයා සමඟ සම්බන්ධකම් පවත් වන්නට විය. එහෙත් රජයට රදළයන් සම්බන්ධ කර නොගැනීම අහිතකර බව පෙනී යාම නිසා එම පිළිවෙල වෙනස් කරන ලදි. 1819 මහනුවර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ පාලනය යටතේ පළමුවරට සහකාර ආණ්ඩුවේ ඒජන්තවරයෙක් මාතලේට පත් කරන ලදි.

කෝල්බෲක් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව 1933.10.01 දිස්ත්‍රික් මායිම් ප්‍රකාශයට පත් කර ඇත. පරිපාලන පහසුව සඳහා දිස්ත්‍රික්කය උතුර, දකුණ හා නැගෙනහිර යනුවෙන් ප්‍රධාන මූලදැනී කොට්ඨාශ තුනකට බෙදන ලදි. මෙම කොට්ඨාශ තුන රටේ මහත්වරුන් තිදෙනෙකුට පවරන ලදි. 1941 අංක 11 පනතින් පසුව රටේ මහත්වරුන් ප්‍රාදේශීය ආදායම් නිලධාරින් වශයෙන් හඳුන්වන ලදි. ප්‍රධාන මූලදැනී කොට්ඨාශ පසුව කොරලේ/පත්තු යනුවෙන් ද ඊට කුඩා ඒකක ගම්මුලාදෑනී වසම් යනුවෙන් ද බෙදා දක්වන ලදි. 1955.04.01 දින මධ්‍යම පළාත භාරව සිටි ඒජන්තවරයාගේ පාලනයෙන් ඉවත් වී මාතලේ දිස්ත්‍රික්කය වෙනම ආණ්ඩුවේ ඒජන්තවරයෙකු යටතට පත්විය.

දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර පාලනයත්, ආදායම් එකතු කිරීමත්, සාමය හා කීර්තිය අපේක්ෂා කිරීමත් ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යභාරය විය. 1948 නිදහස ලැබීමෙන් පසු ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යභාරයට රට සංවර්ධනයට අදාළ සියලුම කුදු මහත් කටයුතු ඇතුළත් විය.

1953දී මාතලේ දිස්ත්‍රික්කයේ කොටසක් පොලොන්නරුව දිස්ත්‍රික්කයට පවරන ලදි. දැනට මාතලේ දිස්ත්‍රික්කය මාතලේ, රත්තොට, දඹුල්ල, ලග්ගල යනුවෙන් ආසන හතරකට බෙදා ඇති අතර මාතලේ, රත්තොට, උකුවෙල, පල්ලේපොල, දඹුල්ල, ගලේවෙල, නාඋල, ලග්ගල, විල්ගමුව, අඹන්ගඟ හා යටවත්ත යනුවෙන් උප දිසාපති කොට්ඨාශ 11කට බෙදා ඇත. ග්‍රාම නිලධාරි වසම් 545කි.වර්තමානයේ ආණ්ඩුවේ ඒජන්ත තනතුර දිස්ත්‍රික් ලේකම් ලෙසත් සහකාර ආණ්ඩුවේ ඒජන්ත තනතුර ප්‍රාදේශීය ලේකම් ලෙසටත් පරිවර්තනය වී ඇති අතර උප දිසාපති කොට්ඨාශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලෙස හැඳින්වේ.

## භූගෝලීය හා සමාජ ආර්ථික පසුබිම ....

ශ්‍රී ලංකාවේ මධ්‍ය ප්‍රදේශය ලෙස සැලකෙන මාතලේ දිස්ත්‍රික්කය විශාලත්වයෙන් ව.කි.මී.1993 කින් සමන්විත වේ. මධ්‍යම පලාතේ උතුරු කොටස නියෝජනය කෙරෙන මාතලේ දිස්ත්‍රික්කය නැඟෙනහිර දේශාංශ 80º 28”, සිට 80º 59” දක්වා හා උතුරු අක්ෂාංශ 7º 24” සිට 8º 01”දක්වා පැතිර පවතී. උතුරින් අනුරාධපුරය ද නැඟෙනහිරින් පොලොන්නරුව, බදුල්ල හා අම්පාර ද දකුණින් මහනුවරද බටහිරින් කුරුණෑගල ද යන දිස්ත්‍රික්ක වලින් මායිම් වන මාතලේ, දිවයිනේ ස්වාභාවික සම්පත් වලින් අනූන ප්‍රදේශ වලින් එකකි.

ලොව අති විශිෂ්ඨ නිර්මාණයක් වූ සීගිරිය ද, සොබාදහමේ අපූර්වතම දායාදයක් වන නකල්ස් කඳුවැටියද පිහිටි මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 ක් පුරා විහිදුනු ගම්මාන 1483 කින් සමන්විත වර්ෂ 2020 වනවිට 524601ක ජනගහනයක් වෙසෙන ප්‍රදේශයකි.

භූගෝලීය පසුබිම

ශ්‍රී ලංකාවේ මධ්‍යම පලාතේ උතුරු අර්ධය නිරූපණය කරන මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටීම හා භූගෝලීය කරුණු මිනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සිතියමේ (පරිමාණය 1 : 63,360) දඹුල්ල, නාලන්ද, කුරුණෑගල, පොලොන්නරුව, ඇළහැර හා රංගල යන අඟලේ සිතියම් වලින් නිරූපණය කෙරේ.

දිස්ත්‍රික්කයේ කඳු ආශ්‍රිත ප්‍රදේශ, ඒකකයක් වශයෙන් ගත් කල මූලික පාෂාණ වර්ගය චානොකයිට්ය. මෙම මූලික පාෂාණ වර්ගය කාලයක් ගතවීමේ දී පෘථිවි අභ්‍යන්තරයේ ඇතිවන නොයෙක් බලපෑම් මත උඩුනැම්, විභේද හා යටි නැමි වලින් සංකීර්ණ ව්‍යූහ සාදයි. මෙම ලක්‍ෂණ නකල්ස් කඳුවැටිය ආශ්‍රිතව දැකිය හැක.

මාතලේ දිස්ත්‍රික්කයේ නැඟෙනහිර සීමාවේ පිහිටි මහවැලි නිම්නය අසල ප්‍රදේශය භූ වර්ගීකරණයට අනුව විජයන් ශ්‍රේණියට අයත් වේ. මහවැලි ගඟේ පිටාර තැන්නක් වන මෙම කලාපයේ විශේෂයෙන්ම අවසාදිත දියළු පස් තැන්පත්ව පවතී.

මාතලේ දිස්ත්‍රික්කයේ භූ විෂමතාවය සැලකීමේදී එය ප්‍රධාන කොටස් 3 කට බෙදා දැක්විය හැක.

උතුරු දිග තැන්න
මාතලේ ද්‍රෝණිය හා නකල්ස් ප්‍රදේශය
ලග්ගල සමාන්තර හෙල්වැටි

උතුරු දිග තැන්නට සාමාන්‍යයෙන් දඹුල්ල, ගලේවෙල, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අයත් වේ. තැන් තැන් වල උස් කඳු හා ශේෂ කඳු වලින් පිරුණු මෙම ප්‍රදේශය සාමාන්‍යයෙන් තැනිතලාවක් හා රළු බිමක ලක්‍ෂණ පෙන්වයි. මෙම ප්‍රදේශයේ පිහිටි ශේෂකඳු අතර සීගිරිය, දඹුල්ල, බෙලියකන්ද පුරාණයේ සිට ප්‍රසිද්ධියක් උසුලයි. මෙම තැනිතලාව සාමාන්‍යයෙන් අඩි 500 - 1000 ත් අතර උන්නතාංශයක් පෙන්වයි.

මාතලේ ප්‍රදේශය ද්‍රෝණියක් ලෙස භූ විද්‍යාත්මකව පෙන්වා දිය හැක. එයට ප්‍රධාන හේතුව කඳු වලල්ලකින් මාතලේ නගරය වටවී තිබීමයි. නකල්ස්, ගුරුළුහෙල පන්සලතැන්න, ඕවිල්කන්ද හා හුන්නස්ගිරි කඳුවැටියෙන් වටවී ඇති මාතලේ නගරය ආශ්‍රිත ප්‍රදේශ මෙසේ ද්‍රෝණියක පිහිටයි. මෙම ප්‍රදේශයේ භූ ලක්‍ෂණ සංකීර්ණ කරවමින් ගලා බසින ගංගාව සුදු ගඟ වේ .රත්තොට හරහා නැඟෙනහිර දෙසට යනවිට රළු භූ විෂමතාවයක් දක්වන නකල්ස් කඳු වැටිය හමුවේ. මුදුන් පහකින් සමන්විත මෙම වැටියේ සාමාන්‍ය උන්නතාංශය අඩි 4000 ක් පමණවේ.

ලග්ගල සමාන්තර හෙල්වැටි කලාපය නකල්ස් කඳුවැටියේ නැඟෙනහිර බෑවුමේ පිහිටි කැපී පෙනෙන ලක්‍ෂණයකි. නකල්ස් වැටියේ සිට ලග්ගල ප්‍රදේශයට සමාන්තරව උතුරු දෙසට විහිදෙන හෙල්වැටි තුනකින් මෙම කලාපය සමන්විත වේ. මින් එක් වැටියක් නකල්ස් හි තෙළඹුගල සිට වස්ගමුව දක්වා ද, දෙවැනි වැටිය නකල්ස්හි වමාරපුගල සිට රණමුරේ හරහා අඹන්ගඟ දක්වා දවිහිදෙන අතර තෙවැනි වැටිය රඹුක්ඔළුව ප්‍රදේශයේ සිට ලග්ගල උඩසිය පත්තුව දෙසට විහිදෙයි.

වනාන්තර ව්‍යාප්තිය දසංකීර්ණය. එහි මධ්‍ය නිරිත හා බටහිර ප්‍රදේශ කඳුකර තෙත් කලාපීය වනාන්තර ද, නකල්ස්හි නැඟෙනහිර ප්‍රදේශ කඳුකර වියළි කලාපීය වනාන්තර ද, උතුරු හා ලග්ගල, විල්ගමු ප්‍රදේශ පහතරට වියළි කලාපීය වනාන්තර වලින් ද සමන්විත වේ. ප්‍රධාන මෝසම් සුලං දෙක මඟින්ම වර්ෂාව ලැබුවත් වැඩි වර්ෂාපතනයක් ලැබෙන්නේ ඊසාන දිග මෝසම් සුලං මඟිනි.

ප්‍රදේශයේ ඛනිජ සම්පත් සැලකීමේදී ලග්ගල, කළුගඟ හා හත්තොට අමුණ මැණික් ද, ඕවල හා කයිකාවල පිඟන් නිෂ්පාදනයට භාවිතා කරන පෙල්ස්පාර් ඛනිජ නිධි ද තලාගොඩ මයිකා නිධි දවැදගත් වේ. තවද හුණු හා කළුගල් කර්මාන්තය ද මහා පරිමාණ වශයෙන් සිදුකෙරේ.

දේශගුණය

| | | |
|---|---|---|
| වාර්ෂික වර්ෂාපතනය | - | මි .මී. **1555.3** |
| අවම සාමාන්‍ය උෂ්ණත්වය | - | සෙ .අංශක **18.5** |
| උපරිම සාමාන්‍ය උෂ්ණත්වය | - | සෙ .අංශක **31.5** |

මාතලේ ඓතිහාසික පසුබිම ....

මාතලේ දිස්ත්‍රික්කයේ ඉතිහාසය සැලකීමේදී ප්‍රාග් ඓතිහාසික යුගයේ යක්ෂ ගෝත්‍රිකයන් විසූ ප්‍රදේශයක් බවට සාක්ෂි හමුවී ඇත. දැනට සොයාගෙන ඇති පුරා වස්තු ව්‍යාප්තිය අනුව දිස්ත්‍රික්කයේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල මොවුන් වැඩි වශයෙන් විසිරී සිටි බව පෙනේ. මෙම ප්‍රදේශ වල පිහිටි හුදකලා ගිරි කුළු ඔවුන්ගේ වෘත්තීය පැවැත්මට ඉතා හිතකර විය. වසර 3000ක් පමණ වයස ඇති මළ සිරුරක් දඹුල්ල අසල ඉබ්බන්කටුව ප්‍රදේශයෙන් සොයාගෙන ඇති අතර ඉහත කරුණ සනාථ කෙරෙන ප්‍රබල සාක්ෂියක් ලෙස එය ගත හැක.

මෙයට වසර 4000 කට පෙර විසූ ලෝ ප්‍රකට රාවණා රජුගේ අගනුවර වර්තමාන ලග්ගල අසල ලක්ගල හෙවත් ලංකාපුරය යැයි කියැවේ. රාවණා නම සඳහන් ස්ථාන කිහිපයක් අදත් ලග්ගල ආශ්‍රිතව පවතී.

විජය කුමරු ලංකාද්වීපයට ගොඩ බසින ලද අවස්ථාවේ කපු කටිමින් සිටි කුවේණියගේ නිජබිම ගලේවෙල අසල බම්බාව යැයි වංශ කථාවල සඳහන් වේ. ඇයගේ පියාද බම්බා නම් වූ අතර ඔහු එම ප්‍රදේශයේ පාලකයා විය. යක්ෂ ගෝත්‍රිකයින් විනාශ කිරීමෙන් පසු මෙම ප්‍රදේශ නෂ්ඨාවශේෂ වූ බව කියැවේ.

ක්‍රි.පූ. 1 වන සියවසේදී පමණ ශ්‍රී මහා බෝධියත් සමඟ මෙරටට පැමිණි ආර්යයන් විසින් මෙම ප්‍රදේශ වල ජනාවාස බිහිකළ බව ඉතිහාස පොත්වල ලියවී ඇත. මෙසේ ජනාවාස ව්‍යාප්ත වීමට ප්‍රධානම හේතු සාධකය වූයේ වී වගාවට ප්‍රමාණවත් ජලය ලබා ගැනීමේ පහසුවයි. 1 වන ගජබා රජු සොළී දේශය ආක්‍රමණය කර රැගෙන ආ 12000 දෙනා පදිංචි කර වූයේද මාතලේ ආශ්‍රිතව බව ජනප්‍රවාදයේ දැක්වේ. මාතලේ කඩඉම් පොත දක්වන ආකාරයට ආර්යයන් ශ්‍රී ලංකාවේ විවිධ ස්ථාන වල පදිංචි වූ අතර ඉන් ස්ථාන 17 වර්තමාන මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත. ඉන් වැඩි ප්‍රමාණයක් ගලේවෙල හා පල්ලේපොල ප්‍රදේශ ආශ්‍රිත ඒවා වේ.

මාතලේ ඉතිහාසයේ කීර්තිමත් කාලපරිච්ඡේදයක් වන්නේ ක්‍රි.පූ. 89 සිට 77 දක්වා වූ වලගම්බා රජ සමයයි. මාතලේ අළුවිහාරයේදී සිදු කළ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ කාර්යය සිදු වූයේ මෙම වකවානුවේදීය. මීලඟ ස්වර්ණමය යුගය එළඹෙන්නේ ක්‍රි.ව. 479 සිට 497 දක්වා වූ කාලයයි. සිය පියාණන් ඝාතනය කර රාජ්‍යය ලබා ගත් කාශ්‍යප කුමරා තම අගනුවර ලෙස දඹුල්ල අසල සීගිරිය තෝරා ගත්තේය. ඔහු විසින් අනුරාධපුර ශ්‍රී විභූතිය සීගිරියට ගෙන එමින් මහාර්ඝ නිර්මාණයක් එහි කරවීය. එතෙක් වනගත ආරණ්‍ය සේනාසනයක්ව පැවති සීගිරිය මනරම් ආලකමන්දාවක් කිරීමේ ගෞරවය කාශ්‍යප රජුට හිමි වේ. වසර 18ක් එහි රාජ්‍යය මෙහෙය වූ ඔහුගේ නිර්මාණය අද වුවත් ලොව මවිත කරවයි. ඔහු විසින් සීගිරිය අවට කරවූ ගොඩනැගිලි හා ජල තාක්ෂණය නූතන ඉංජිනේරු තාක්ෂණයටත් අභියෝගයකි. එසේම සීගිරි පර්වතයේ කළ බිතු සිතුවම්ද විශිෂ්ඨ නිර්මාණයක් බව පැහැදිලිය.

අනුරාධපුර පාලනයේ අවසන් යුගයේ මානවම්ම රජ සමයේ ලැබුනු තවත් දායාදයක් ලෙස නාලන්දා ගෙඩිගෙය හැඳින්විය හැක. පල්ලව ගෘහ නිර්මාණ ශිල්පයට අනුව හින්දු ආභාෂය මුසු වූ නිර්මාණයක් ලෙස මෙය හැඳින්විය හැකි අතර දිවයිනේ මධ්‍ය කේන්ද්‍රය මෙම ස්ථානය බව පිළිගැනීමක් ඇත.

පොළොන්නරුව පළමු පාලකයා වූ විජයබාහු රජතුමා සොලීන්ගෙන් රට ගලවා ගැනීමේ මුල්ම කුමන්ත්‍රණය සිදු කළේ දඹුල්ල අසල මැණික්දෙන නම් ස්ථානයේදීය. එසේම ඔහුගේ ප්‍රධාන සටන් මධ්‍යස්ථානයක් ලෙසද එය තෝරා ගත්තේය. 1 වන පරාක්‍රමබාහු කුමරා, පොළොන්නරු පාලක ගජබා රජුට එරෙහිව කළ සටන් සඳහා ප්‍රධාන සටන් මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ නාලන්දාවයි. මීට අමතරව සැලගම, බෝගම්බර, ලග්ගල, රණමුරේ, අඹන ආදී ප්‍රදේශද උප සටන් මධ්‍යස්ථාන ලෙස යොදා ගත්තේය. පොළොන්නරුව අවසන් පාලකයා වූ නිශ්ශංකමල්ල රජු දඹුලු විහාරය රන් ගල්වා ප්‍රතිසංස්කරණය කළ අතර අනතුරුව එය රන්ගිරි දඹුලු විහාරය

ලෙස හැඳින්වූ බව කියැවේ. එසේම ඔහුගේ සිංහාසනය නිර්මාණය කිරීම සඳහා බෙලියකන්දෙන් ගල් පර්වතයක් ගෙන ගිය බවද කියැවේ.

ගම්පොල විසූ 3 වන වික්‍රමබාහු තමාට එරෙහිව උතුරේ විසූ ද්‍රවිඩ රජෙකුවන ආර්යය චක්‍රවර්තී විසින් සේනාවක් එවූ බව දැන රයිගමට පලා ගියේය. එම ද්‍රවිඩ සේනාව මාතලේ නගරයේ ආසන්නයේ කඳවුරු ලා සිටින අවස්ථාවේදී ස්වකීය අභිමතය පරිදි මාතලේ ජනතාව ඔවුන් සමඟ සටන් කළහ. එහිදී ද්‍රවිඩ සේනාවේ විශාල පිරිසක් මිය ගිය අතරම සෙසු පිරිස පලා ගියහ. මෙය ලක් ඉතිහාසයේ පාලකයකුගේ මඟ පෙන්වීමකින් තොරව කළ එකම සටන බව කියැවේ.

කෝට්ටේ යුගයේ 6 වන පරාක්‍රමබාහු රජුගෙන් පසු ලක්දිව එක්සේසත් භාවය බිඳී ගියේය. අනතුරුව උඩරට රාජ්‍යයේ කොටසක් වූ මාතලේ ප්‍රදේශයට යුව රජකු වශයෙන් විජයපාල කුමරා පත් කරන ලදි. මෙකල කන්ද උඩරට පාලකයා වූයේ ඔහුගේ පියා වූ සෙනරත් රජතුමාය. ගොඩපල තම මාළිගය සාදා එහි සිට පාලනය ගෙන ගිය විජයපාල කුමරා දක්ෂ සටන් කරුවකු විය. පෘතුගීසීන් සමඟ සටන් කර ඔවුන් දරුණු ලෙස පරාජයට පත් කිරීමට මේ කුමරා සමත් විය. ක්‍රි.ව. 1635 දී මේ කුමරා මාතලෙන් පලා ගිය අතර එතැන් සිට මාතලේ කන්ද උඩරට පාලනයට නතු විය. 1815 දී මාතලේ ප්‍රදේශය ඇතුළු උඩරට රාජ්‍යය බ්‍රිතාන්‍ය පාලනයට නතු විය. බ්‍රිතාන්‍යයන්ට මාතලේ වැඩි වැදගත් කමක් ඉසුලූයේ වතු වගාවට හා ත්‍රිකුණාමළ සිට මහනුවර මාර්ගය මාතලේ හරහා වූ බැවිනි. සොලී හා ද්‍රවිඩ ආක්‍රමණ වලදීද රජරට රජවරු කන්ද උඩරටට පලා යාමට යොදා ගත්තේ මාතලේ හරහා වූ මාර්ගය වේ. විශේෂයෙන් කන්ද උඩරටත්, රජරටත්, ත්‍රිකුණාමළයත් සම්බන්ධ වූයේ මාතලේ හරහාය. 1803 හා 1815 කන්ද උඩරට ආක්‍රමණ සඳහා බ්‍රිතාන්‍යයන් මෙම මාර්ගය යොදා ගත්තේය. 1803 ආක්‍රමණය සඳහා ඔවුන් මාතලේ අසල මැක්ඩෝවල් කොටුව ඉදිකළ අතර ආක්‍රමණය අසාර්ථක වීමත් සමඟම එයද විනාශ විය. වර්තමානයේ මාතලේ ප්‍රසිද්ධ සුසාන භූමිය ලෙස යොදා ගැනෙන්නේ මෙම බලකොටුව තිබූ ප්‍රදේශය වන අතර එහි නටබුන් අදටත් දක්නට ඇත.

1848දී දියත් වූ කැරැල්ල මාතලේ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. මෙම කැරැල්ලේ සම්පූර්ණ සැලසුම් හා ක්‍රියාත්මක වීම් සිදුවූයේ මාතලේ දිස්ත්‍රික්කය තුළදීය. වීර පුරන්අප්පු හා ගොංගාලේගොඩ බංඩා විසින් මෙහෙය වූ මෙම කැරැල්ල අසාර්ථක වීමත් සමඟම නායකයන් සියළු දෙනාම මාතලේදී අත්අඩංගුවට ගෙන ජීවිතක්ෂයට පත්කරන ලදි.

ශ්‍රී ලංකාවේ කීර්ති නාමය රන්දූ ඇහැලේපොල නිළමේ, ඇතිපොල නිළමේ හා වීර මද්දුම බණ්ඩාරද මෑත යුගයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාර හා ජනාධිපති වූ විලියම් ගොපල්ලව මහතාගේ නිජබිම මාතලේ දිස්ත්‍රික්කයේය. එසේම මහනුවර රාජධානියේ රජවරුන්ගේ විශ්වාසවන්තම නිළමේ වරු හා නිලධාරීන් විශාල ප්‍රමාණයක් මාතලේ සිය නිජබිම කරගෙන තිබුණි.

## Administrative, Geographical & Socio EconomicBackground of Matale District

### Administrative Struture of Matale Duastrict …

King was the supremo who ruled the country until subjugate to the British. Ancient Matale which existed under the Pihity, Maya as well as Up Country had fall under the administration of King who called as Godapala Vijayapala in 17$^{th}$ A.D. Group of higher Officials who served under the King was denoted as Disawa, Adikaram, Lekam Mahattaya, Rate Mahattaya andMuhandiram.

Book of boundries (Kadaim Potha) has indicated that Matale area ruled under a Disawa who named as Ethipola Dukgannarala of Matale. Aboard commissioners had been appointed with powers of authority and judicial instead of individual Resident officer of up country after 1818. In this circumstance, government had connected directly with public. But, the order had changed as it seemed that non-intervention of aristocracy to the government had created a kind of adversary situation. Accordingly, An Assistant Government Agent had been appointed firstly to the Matale 1819 under the Government Agent of Kandy.

Boundaries of District had been proclaimed in 01.10.1933 as per the recommendation of Coll Broock Commission. The district had been divided in to three main Muladeny Divisions such as North, South and East for the easement of administration. Thease three divisions had been assigned to three of Muladenys. The authorized people were introduced as Divisional Revenue Officers by Act No.11 of 1941 after the position of Rate Mahattaya. Later, Main Muladeny divisions had been fallen under separate Government Agent at 01.04.1955 by detaching the Government Agent of Central Province.

Internal administration activities of the district, collecting of income and Expecting of peace and fame were initial Responsibilities of the Government Agent at that time. All kind of activities relevant to the development movements of the country had included to the responsibilities of the Government Agent after receiving of independence in 1948.

Apart of Matale District has assigned to the Polonnaruwa District in 1953. Presently, Matale District had divided in to four Seats as Rattota, Dambulla, Galewela and Laggala as well as it has consisted 11 Divisional Secretariats such as Matale, Rattota, Ukuwela, Pallepola, Dambulla, Galewela, Naula, Laggala, Wilgamuwa, Ambangaga and Yatawatta. Government Agent and Assistant Government Agent had converted to the designations of District Secretary and Divisional Secretary and Assistant Government Agent Division in to Divisional Secretary’s Divisionals.

**Geographical & Socio EconomicBackground of Matale District ….**

Considered the centre of Sri Lanka, the district of Matale has a total area of 1993 square kilometers. The district represents the Northern portion of the Central Province and spreads along from Eastern longitude $80^{0}28^{'}$ to $80^{0}$ $59^{'}$ and Northern altitude $7^{0}$ 24 to $8^{0}$ $01^{'}$.The district is bordered by the districts of Anuradhapura on the north and by Polonnaruwa, Badulla & Ampara on the East and by Kandy on the South and by Kurunegala on the West. The district of Matale is blessed with a great deal of valuable resources.

One of the greatest creations of the world Sigiriya and the natural settings of the Knuckles range of mountains adorn the district. It consists of 11 Divisional secretariats spread along the district within 1483 Villages. By the year **2020** the population stood at **524601** in the district.

**<u>Geographical Setting</u>**

Matale district is denoted as representing the Northern part of the Central Province per the Survey Department map (Scale 1:63360) Dambulla, Nalanda, Kurunegala, Polonnaruwa, Elahera and Rangala as shown in the one inch scale maps.

Taken as a unit the mountainous regions of the district comprises of the Ore Charnokoit. These have been compressed through various internal movements of the soil and these basic Ores have now formed complex structures which could be observed in the Knuckles range area of mountains.

The landscape differences of the district could be divided into three,

Northern range plain
Matale basin and Knuckles region
Parallel ridges of Laggala

The regions of Dambulla, Galewela, Pallepola belongs to the northern regional secretarial areas. Occasional high mountains and small hills are found in this area and are generally full of flat land and some rough land areas.

Matale region is considered a valley as the township of Matale is surrounded by circle of mountains. The Knuckles, Guruluhela, Pansala tenna, Owilikanda and Hunnasgiriya mounts situated right around the town of Matale has resulted in Matale town being geographically identified as a valley. The landscape has become complex due to the Kaluganga flowing across this region. Moving towards the east through Rattota the rough landscape of the Knuckles range of mountains could be reached. This mountain range consists of five peaks with an average altitude of 4000 feet.

Laggala Parallel ridges Zone extends from the east of Knuckles it is a very conspicuous characteristic three ridges extends parallel from Knuckles to Laggala region northwards. One of them extends from

Thelambugala in Knuckles to Wasgamuwa. The second extends from Wamarapugala across Ranamure towards Ambanganga and the third extends from Rambukoluwa to Laggala Udasiya Pattuwa.

The forest range too is complex. The central, Southwest and western regions of the forest ranges are wet zonal and the range from Knuckles eastern comprises the hilly dry zone while northern and Laggala Wilgamuwa region comprises the low country dry forests. The area receives both monsoonal rains but most of the rain is received during the North Eastern monsoon season.

As regards the mineral resources the regions of Laggala, Kaluganga and Hattota Amuna are gemming areas while Owala and Kaikawala are full of feldspar a mineral used in the manufacture of porcelain products and Thalagoda regionis fullof mica deposits. In addition, large scale manufacture of lime and granite are flourishing industries in the area.

**Climatic Conditions**

| | | |
|---|---|---|
| Annual rainfall | - | 1555.3 mm |
| Minimum average temperature | - | 18.5 $^0$c |
| Maximum average temperature | - | 31.5 $^0$ c |

**Historical Background of Matale ….**

The history of Matale dates back to the period when in the pre-historic era the inhabitants are believed to be from the Yaksha tribe. According to the historical findings. Up to now these tribes have lived mostly in the northern & eastern regions. The natural setting of the isolated rocks had been beneficial for their livelihoods. Excavations have revealed that these historical details after a three thousand-year-old corpse were found in Ibbankatuwa in Dambulla region.

The place called Lakegala or Lankapuraya in the Laggala area was earlier presumed to be the place where world famous king Rawana had lived almost 4000 years ago. This place is believed to be the capital city of king Ravana. There is a number of places in Laggala bearing the name of Ravana.

The place presently called Bambawa in Galewela is claimed to be the village in which Kuweni was weaving when king Vijaya landed in our island according to legend her father was called Bamba and he was the ruler of the area at that time. After the annihilation of the Yaksha tribe these places turned and to be deserted ruins.

In the first century B.C. when the Ariyans arrived with the Sri Maha Bhodiya new settlements were established in this in this area according to history. The main reason for the establishment of settlements

in this area was due to the easy access to irrigation facilities to cultivate paddy. King Gajaba 1 when he invaded the chola land had brought 12000 people and they are believed to have been settled in places close to Matale according to legend. According to the book of Matale the Ariyans had been settled down in many places in the country out of which around 17 such areas are presumed to be situated in Matale district. Most of these areas are in the areas of Galewela and Pallepola.

The most remarkable and unique period of the history of Matale was during the reign of king Walagamba from 89 to 77 B.C. The Thripitakaya which was written in Aluwiharaya had been done during this period of rule. The next golden era had been from 479 to 497 A.D. prince Kashyapa after assassinating his father usurped power had established his kingdom in the place called Sigiriya close to Dambulla. He had managed to bring about the splendor of Anuradhapura to Sigiriya and had created a masterpiece in art at Sigiriya through architectural talent. Sigiriya which was hither to a forest heritage being transformed into a magnificent Alakamandawa had made king Kashyapa a famous ruler. He had ruled in his kingdom for 18 years and the magnificent artistic creations done by him. He is world famous even today. The construction work carried out by him in and around Sigiriya in the spheres of architecture and water technology is considered a great challenge to the modern engineers. The Sigiriya frescos on the walls of the rock are considered great artistic creations.

During the reign of king Manawamma in the latter part of the Anuradhapura era another endowment received for the district of matale was the renowned Nalanda Gedige.This is considered to be built according to the Pallawa architectural tradition under the influence of Hinduism. The Nalanda Gedige according to its location is considered to be the centre of the island of Sri Lanka.

The first ruler of Pollonnaruwa king Vijayabahu conspired to overthrow the Cholas for the first time in Menikdena close to Dambulla. Then onwards he chose the same site as his main centre to attack the enemy. Prince Parakramabahu the 1st chose Nalanda as his base to fight against King Gajaba. In addition to this he established sub camps at Selagama, Laggala, Ranamure and Ambana for the same purpose.

The last ruler of Pollonnaruwa king Nissankamalla has reconstructed the Dambulla Viharaya by gold plating it and had named it Rangiri Dambulla Viharaya. He had also transported a huge rock from Beliyakanda to be cast into his throne.

King Vikramabahu the 3rd who lived and ruled in Gampola had fled to Raigama when he heard that a Dravidian king by the name of Arya Chakrawarthy had sent a battalion to attack his kingdom. This Dravidian army was stationed at place near Matale Township. The people of Matale were believed to have fought with them easing many casualties and the remaining Dravidians had fled. This is reported to be the first instance in the history of our country that a group of people had organized themselves to attack an enemy without the guidance and directions of a ruler.

King Parakramabahu the 6th who ruled in the Kotte era ended his period of rule and that was the end of unity of Sri Lanka. After that the region of Matale which was a portion of the Kandyan Kingdom came under the rule of prince Wijayapala an heir to the throne. At this time kingdom of Kandy was ruled by king Senarath the father of Prince Wijayapala. Prince Wijayapala built his palace in Godapola and ruled from there and he was a talented fighter. He was able face the Portuguese army and defeats them in battle. In the year 1635 prince Wijayapala fled from the Matale area and from hence forth matale came under the Kandyan kingdom.1815 Kandyan kingdom including Matale came under British rule. Matale was important to the British for plantation and also because the Kandy – Trincomalee road passed through Matale.

During the Chola and Dravidian invasions the kings of Rajarata used the road through Matale to the Kandyan kingdom. Very specially the Kandyan, Rajarata and Trincomalee were connected via Matale.1803 and 1815 invasions of the British were done via the Matale route. In 1803 the British built the MacDowall fort but with the failure of the invasion it too was destroyed. At present the public cemetery of Matale is the place where this MacDowall was and its ruins could be seen there. The rebellion of Matale in 1848 is a historic event of Matale. This rebellion was planned and executed within the Matale district. This was led by Veera Puran Appu and Gongale Godabanda but when it failed all the leaders were arrested and killed.

The historical heroes who brought fame to Sri Lanka namely Ehelepola Nilame, Etipola Nilame, Brave Medduma Bandara and the first governor of the recent past William Gopallawa were born in Matale. In addition to this the most trusted Nilames and also officials of the Kandyan Kings were mostly born and bred in Matale Region.